**ශීර්ෂය 150 - ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2017 වර්ෂය**
------------------------------------------------------------------------------------------------------------

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශනය, වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ 3.1.2 වගුවේ ඇතුළත් ආදායම් සංකේතයට අදාළ ආදායම් ගිණුම ද, ශීර්ෂය 150 දරන ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුම්වලින් හා සැසඳුම් ප්‍රකාශනවලින් නිරූපණය වන මූල්‍ය හා කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ආදායම් ගණන් දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

------------------------------------------------------------------------------------------------

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 රෙගුලාසිය ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණය ද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යාවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරීයා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

----------------------

ශීර්ෂය 150 - ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල වීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 ජූලි 17 වන දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

------------------------

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ සිදු කරන ලද විගණනයේ දී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.15 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 127 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේ දී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටුකර තිබුණු බව නිරීක්ෂණය විය.

| මුදල් රෙගුලාසි 127 ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරී එම විධිවිධානයන්ට අනුගත වී නොතිබීම | නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|---|
| **මුදල් රෙගුලාසි** | | | |
| 127 (1)(අ) | නිවැරදිව සහ මූල්‍ය විධිමත් බවෙන් යුක්තව කටයුතු කරන බව තහවුරුවන පරිදි සියළු මූල්‍ය කාර්යයන් සැලැසුම් කළ යුතු වීම.<br>(දෙපාර්තමේන්තු කටයුතු සිදු කළ යුත්තේ හුදෙක් මූල්‍ය හා දෙපාර්තමේන්තු නියෝගවලට අනුකූලව පමණක් නොව, රාජ්‍ය කටයුතු ඉටුකිරීමේ දී බලාපොරොත්තු පිළිබඳ උසස් තත්ත්වයන්ට අනුකූල බව) | 1. ක්‍රියාකාරී සැලැස්ම නිවැරදි ලෙස පිළියෙල කර නොතිබුණි. | 2.3.2 |
| | | 2. ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කාර්යභාරයන් ඉටු නොකිරීම. | 2.3.3(අ) |
| | | 3. ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාණවත් පරිදි සැලසුම් කිරීම. | 2.4.1 |
| | | 4. ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම. | 2.11 |
| 127(1)(ආ) | වියදම් සහ රාජ්‍ය ආදායම් එකතු කිරීම පිළිබඳව ප්‍රමාණවත් තරම් පාලනයකට විධිවිධාන සැලැසෙන ක්‍රමයක් සම්පාදනය කළ යුතුවීම. | 1. කළමනාකරණ අඩුපාඩු | 2.7 |
| | | 2. අනුකූල නොවීම් | 2.5 |
| | | 3. මානව සම්පත් කළමනාකරණයේ අඩුපාඩු | 2.13 |

| | | | |
|---|---|---|---|
| 127(2) | තමාගේ පාලනය යටතේ පවත්නා දෙපාර්තමේන්තුවල එවකට තිබෙන වැය විෂයයන් මෙන්ම අළුතින් හෝ වැඩියෙන් වියදම් කිරීම සඳහා වන යෝජනා සැකසුරුවම්කම හා කාර්යක්ෂමතාවය අතින් අමාත්‍යාංශයේදී තියුණු පරීක්ෂාවකට භාජනය කිරීම. | ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන් | 2.3.3(ආ) |
| 127(3) | ස්වකීය පරිපාලනාත්මක කෘතහස්තතාව හා විචාර බුද්ධිය මෙහෙයවා සුදුසු පරිදි ක්‍රියා කළ හැකි වන පිණිස සැකැයක් හෝ උද්ගත වී ඇති සියළු ප්‍රශ්න තමා වෙත ඉදිරිපත් වෙන ආකාරයක් සලසා තිබීම. | 1. වාහන උපයෝජනයේ අඩුපාඩු<br>2. බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්<br>3. වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම.<br>4. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයන් කිරීමේ අඩුපාඩු | 2.5(අ)<br>2.5(ඉ)<br>2.5(ඊ)<br>2.5(ඇ) |
| 127(6) | ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම පිට පවත්නා වූ ආදායම් නොහොත් රජයට ලැබිය යුතු වෙනත් ගාස්තු එකතු කිරීමේ කාර්යය ගැන දැඩි සෙවිල්ලෙන් සිටිමින් එම කාර්යය අමාත්‍යාංශයේ පරීක්ෂණයට භාජනය කිරීම. | 1. ආදායම් ගිණුම්වල අඩුපාඩු<br>2. රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ සඳහන් අඩුපාඩු | 2.9(ආ)<br>2.10 |
| 127(7) | නිලධාරීන්ගේ/සේවකයින්ගේ ප්‍රමාදය, නොසැලැකිල්ල, වරද හෝ වංචාව නිසා රජයට පාඩු සිදු වී ඇති අවස්ථාවලදී මුදල් රෙගුලාසි 103 සිට 108 දක්වා රෙගුලාසිවල නියම කර ඇති කාර්ය පරිපාටිය ගණන්දීමේ නිලධාරීන් විසින් අනුගමනය කරනු ලබන බවටද, මුදල් රෙගුලාසි 156(1) අනුව එම පාඩු සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්/සේවකයන් මත අධිභාර පැනවීමද, වගබලා ගැනීම පිණිස විධිවිධාන යොදන ලද්දේනම් තමා වෙත පැවැරී ඇති | 1. අනාර්ථික ගනුදෙනු<br>2. මුදල් සම්බන්ධව කටයුතු කරන නිලධාරීන්ගේ ඇප තැන්පත් ලබා නොගැනීම. | 2.6<br>2.14 |

වගකීම්වලින් ගණන්දීමේ නිලධාරියා නිදහස් වූවාක් ලෙස සලකනු ලැබේ. රාජ්‍ය ගිණුම් කාරක සභාව හමුවේ පෙනී සිට, තමා වගකීම් දරන දෙපාර්තමේන්තුවල ගිණුම් පැහැදිලි කිරීමෙන් හා සාධාරණීය කිරීමෙන් ගණන්දීමේ නිලධාරියා සමඟ සහාය වීමද ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ රාජකාරී භාරයක් වීම.

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

------------------------------------------------------

### 2.1 අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන්

------------------------------------------

(අ) ඛනිජතෙල් සම්පත් සංවර්ධන පිළිබඳ විෂයයන්ට සහ ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව, සීමාසහිත ලංකා ඛනිජතෙල් ගබඩා පර්යන්තය, ඛනිජතෙල් සම්පත් සංවර්ධන කාර්යාංශය සහ සීමාසහිත පොලිප්ටෝ ලංකා පුද්ගලික සමාගම යන ව්‍යවස්ථාපිත ආයතනයන් හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය, පසු විපරම් කිරීම හා ඇගයීම.

(ආ) ඛනිජතෙල් ආශ්‍රිත නිෂ්පාදන හා ස්වභාවික ගෑස් ආනයනය කිරීම, පිරිපහදුව, ගබඩා කිරීම, බෙදාහැරීම සහ අලෙවි කිරීම.

(ඇ) ඛනිජතෙල් නිෂ්පාදනය හා පිරිපහදුව සම්බන්ධ කටයුතු

(ඈ) ඛනිජතෙල් ගවේෂණය හා ඒ ආශ්‍රිත කටයුතු

(ඉ) ඛනිජතෙල් නිෂ්පාදන ප්‍රභවයන්ගෙන් ගෑස් නිෂ්පාදනය හා බෙදා හැරීම.

(ඊ) ඉන්ධන සැපයීම හා බෙදාහැරීමට අදාළ වන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

(උ) ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව, සීමාසහිත ලංකා ඛනිජතෙල් ගබඩා පර්යන්තය, ඛනිජතෙල් සම්පත් සංවර්ධන කාර්යාංශය සහ සීමාසහිත පොලිප්ටෝ ලංකා පුද්ගලික සමාගම යන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියළුම විෂයයන්ට අදාළ කටයුතු

(ඌ) ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව, සීමාසහිත ලංකා ඛනිජතෙල් ගබඩා පර්යන්තය, ඛනිජතෙල් සම්පත් සංවර්ධන කාර්යාංශය සහ සීමාසහිත පොලිප්ටෝ ලංකා පුද්ගලික සමාගම යන ආයතනයන් අධීක්ෂණය කිරීම.

**2.2 අමාත්‍යාංශය යටතේ ඇති ආයතන හා එමඟින් ඉටුකළ යුතු කාර්යභාරයන්**

අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කර ඇති ආයතන හා ඒවායේ කාර්යභාරය පහත දැක්වේ.

| | අමාත්‍යාංශය යටතේ ඇති ආයතන | ස්ථාපිත කිරීමේ අධිකාරි බලය | කාර්යභාරය |
|---|---|---|---|
| (i) | ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව | 1961 අංක 28 දරන ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථා පනත | • ඛනිජතෙල් පිරිපහදු කිරීම.<br>• උසස්ම තත්ත්වයේ ඛනිජතෙල් නිෂ්පාදන අලෙවි කිරීම.<br>• කාර්යක්ෂම බෙදාහරින්නන් ජාලයක මාර්ගයෙන් පාරිභෝගික අවශ්‍යතාවයන් ඉහළින්ම ඉටු කිරීමට කටයුතු කිරීම.<br>• උසස්ම ආචාරධර්මවලට අනුකූලව සෞඛ්‍යය, ආරක්ෂාව සහ පාරිසරික යන අංශ කෙරෙහි දැඩි අවධානය යොමු කරමින් ව්‍යාපාරික හවුල්කරුවන්ගේ අභිමතාර්ථයන් මුදුන්පත් කිරීම. |
| (ii) | ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්තය | 2007 අංක 07 දරණ සමාගම් පනත | • බොර තෙල් පිරිපහදු කිරීම.<br>• පිරිපහදු කරන ලද ඛනිජතෙල් ගබඩා කිරීම හා බෙදි හැරීම |
| (iii) | ඛනිජතෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලය | 2003 අංක 26 දරණ ඛනිජතෙල් සම්පත් පනත | • දේශීය ඛනිජතෙල් සම්පත් ගවේෂණ කටයුතු, කැණීම සහ ලබා ගැනීම.<br>• ජාතික බලශක්ති සුරක්ෂිතතාවට දායක වීම. |
| (iv) | පොලිප්ටෝ ලංකා පුද්ගලික සමාගම | 2007 අංක 07 දරණ සමාගම් පනත | • ඉවතලන ප්ලාස්ටික් ඉන්ධන බවට හෝ පරිසර හිතකාමී වෙනත් ඛනිජතෙල් ආශ්‍රිත නිෂ්පාදන බවට පරිවර්තනය කිරීමේ ශ්‍රී ලාංකීය නව සොයා ගැනීම සරලව, ආරක්ෂාකාරී හා ලාභදායී අන්දමින් වාණිජකරණය කිරීමෙන් ක්‍රියාකාරී ලෙස පරිසරය |

සංරක්ෂණය කිරීමට දායක වීම. එමඟින් ඛනිජතෙල් ආනයනය සඳහා වැයවෙන්නා වූ විදේශ විනිමය අඩු කර ගැනීම.

- මේ සඳහා සැසඳෙන වෙනත් නව සොයා ගැනීම් ප්‍රවර්ධනය කිරීම.

**2.3 කාර්යසාධනය**

---

**2.3.1 අමාත්‍යාංශයේ දැක්ම හා මෙහෙවර**

---

ඉන්ධන සැපයුමෙහි ගුණාත්මක තත්ත්වය හා විශ්වාසනීයත්වය දියුණු කිරීම ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ අරමුණක් වී තිබුණි. මේ සඳහා අදාළ ප්‍රතිපත්ති වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය පසුවිපරම් කිරීම හා ඇගයීම අමාත්‍යාංශයේ කාර්යයක් වී තිබුණි. 2017 ජනවාරි 25 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ දී ඉන්ධන පිරවුම්හල් භෞතික පරීක්ෂාවන් සිදුකරන ලෙස අමාත්‍යාංශයට නියෝග ලබා දී තිබුණි. ශ්‍රී ලංකාව තුළ දැනට පවතින ඉන්ධන පිරවුම්හල් 1,461 න් 1,254 ක් ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවට අයත් අතර ඉන් පිරවුම්හල් 35 ක් එනම් සියයට 2.8 ක් පමණක් 2017 වර්ෂයේදී භෞතික පරීක්ෂාවට ලක් කර තිබුණි. ඉතිරි පිරවුම්හල් 207 ලංකා ඉන්දියානු තෙල් සමාගමට අයත් අතර එම පිරවුම්හල්වල ඉන්ධන අලෙවි කිරීමේ සේවාව සම්බන්ධව අධීක්ෂණයක් අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සිදුකර නොතිබුණි.

**2.3.2 සැලසුම් කිරීම**

---

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව, 2017 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර තිබුණි. ඒ අනුව, අමාත්‍යාංශය විසින් ඉටු කළ යුතු ප්‍රධාන කාර්යභාරයන් 8 ක් ඉටු කිරීම සඳහා ක්‍රියාකාරකම් 24 ක් එම සැළැස්මට ඇතුළත් කර තිබුණි. එහෙත් පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මේ පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයට යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සේවයේ සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ආදායම් ශීර්ෂය වෙනුවෙන් ආදායම් එකතු කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

(ඇ) වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක්මුදල් අවශ්‍යතා සැලැස්ම පිළියෙල කොට නොතිබුණි.

**2.3.3 කාර්යභාරයන් ඉටු නොකිරීම**

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කාර්යභාරයන් ඉටු නොකිරීම**

---

වාර්ෂික ක්‍රියාකාරී සැළැස්මේ ඇතුළත් පහත සඳහන් කාර්යභාරයන් ඉටු කර නොතිබුණි.

**(i) 2002 අංක 33 දරන ඛනිජතෙල් නිෂ්පාදන (විශේෂ විධිවිධාන) පනත සහ 1961 අංක 28 දරන ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථා පනත සංශෝධනය කිරීම**

---

2004 වර්ෂයේ සිට ඛනිජතෙල් කර්මාන්තය සම්බන්ධයෙන් නියාමන අධිකාරියක් නොමැති වීම නිසා ඛනිජතෙල් කර්මාන්තයද, 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභා පනත යටතේ නියාමනයට ලක් කෙරෙන කර්මාන්ත අතරට ඇතුළත් කිරීම සඳහා 2006 වර්ෂයේදී පාර්ලිමේන්තුවේ යෝජනාවක් සම්මත කරගෙන තිබුණි. ඒ අනුව, කර්මාන්තය නියාමනයට අවශ්‍ය මෙවලම් මහජන උපයෝගීතා කොමිෂන් සභාවට සපයා දීම සඳහා 2002 අංක 33 දරන ඛනිජතෙල් නිෂ්පාදන (විශේෂ විධිවිධාන) පනත සහ 1961 අංක 28 දරන ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථා පනත යන පනත් දෙක සංශෝධනය කිරීමට අදාළ මූලික කටයුතු 2006 වර්ෂයේදී ආරම්භ කොට තිබුණද එම පනත් සංශෝධනයන් 2018 ජුනි 30 දින වන විටත් සිදු කොට නොතිබුණි.

**(ii) ජාතික වායු ප්‍රතිපත්තිය සැකසීම**

2015 සැප්තැම්බර් 21 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් ස්වාභාවික ගෑස් පිළිබඳව ජාතික ප්‍රතිපත්තියක් සැකසීම සඳහා ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය වෙත බලය ලබාදී තිබුණි. 2017 වර්ෂය අවසන් වන විට සකස් කර අවසන් කිරීමට සැලසුම් කර තිබුණු මෙම ජාතික වායු ප්‍රතිපත්තිය 2018 ජුනි 20 දින වන විටත් අවසන් කර නොතිබුණි.

**(ආ) ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

පහත සඳහන් ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන් නිරීක්ෂණය විය.

**(i) ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංකීර්ණය සංවර්ධනය හා පුනරුත්ථාපනය**

භූගෝලීය පිහිටීම අනුව මුළු ලෝකයේම අවධානය යොමු වී ඇති ලෝකයේ දෙවන ගැඹුරුතම වරාය වන ත්‍රිකුණාමලය වරාය තුළ වර්ෂ 1930 සිට ස්ථාපිත කර ඇති තෙල් ටැංකි පද්ධතිය ඝන මීටර් 12,500 ක ධාරිතාවකින් යුක්ත වන අතර එය ටැංකි 102 කින් හා අනෙකුත් ආශ්‍රිත පහසුකම්වලින් සමන්විත වේ. දැනට පවතින 99 ක් වූ මුළු ටැංකි ප්‍රමාණයෙන් පහළ කොටසේ ටැංකි 14 ක් ලංකා ඉන්දියානු තෙල් සමාගම විසින් භාවිතා කරනු ලැබේ. අතහැර දමා තිබෙන ඉහළ කොටසේ ඇති ටැංකි 84 නවීකරණය සඳහා මූලික තීරණ ගැනීමේ කටයුතු 2015 අප්‍රේල් 29 වන දින ආරම්භ කර තිබුණද මේ වන තුරු අවසන් තීරණයකට එළඹ නොමැති බැවින් මෙම ටැංකි සංවර්ධනය හා පුනරුත්ථාපනය කිරීමට නොහැකි වී තිබුණි.

**(ii) තෙල් පිරිපහදුව නවීකරණය හා පුළුල් කිරීම**

1969 ස්ථාපිත කරන ලද වර්තමාන තෙල් පිරිපහදුව නවීකරණය හා පුළුල් කිරීම සම්බන්ධව 2015 මාර්තු 15 දින සිට ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක කමිටු රැස්වීම් කිහිපයකදී විස්තරාත්මකව සාකච්ඡා කර තිබුණි. යෝජිත ව්‍යාපෘතියේ මූල්‍ය ශක්‍යතාවය අධ්‍යයනය කිරීම සඳහා විද්වත් කමිටුවක් පත් කර තිබුණ ද 2018 ජුනි 30 දින වන විටත් ඒ සම්බන්ධව ප්‍රගතියක් අත්කර ගෙන නොතිබුණි.

**(iii) බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ තෙල් සැපයුම් නල පද්ධතිය නවීකරණය හා පුළුල් කිරීම**

---

බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ තෙල් සැපයුම් නල පද්ධතිය නවීකරණය හා පුළුල් කිරීම පිළිබඳ ව්‍යාපෘතියේ සංරචක ලෙස අතිරේක ගබඩා පහසුකම් ඇති කිරීම සහ දැනට පවතින තෙල් සැපයුම් නල පද්ධතිය නවීකරණය හා පුළුල් කිරීමේ අංග ඇතුළත් වී තිබුණි. ව්‍යාපෘතියේ ඉංජිනේරු ඇස්තමේන්තුව ඇමරිකානු ඩොලර් මිලියන 61 ක් වේ. 2015 දෙසැම්බර් 09 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ඉංජිනේරු ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුකූලව ජාත්‍යන්තර ලංසු කැඳවීමට තීරණය කර තිබුණි. ඒ අනුව 2017 දෙසැම්බර් 07 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සිදුකර තිබුණි. නමුත් 2017 නොවැම්බර් මාසයේදී ආරම්භ කිරීමට නියමිතව පැවති මෙම ව්‍යාපෘතිය 2018 ජුනි 30 දින වන විටත් ආරම්භ කර නොතිබුණි.

**(iv) නව ඉන්ධන තොග ගබඩාවක් උතුරු පළාතේ ස්ථාපනය කිරීම**

---

කන්කසන්තුරේ සිමෙන්ති සංස්ථාව සතු භූමියේ පිහිටා ඇති තෙල් තොග ගබඩාව, එම ස්ථානයෙන් ඉවත් කර ගන්නා ලෙසට 2011 වර්ෂයේදී සිමෙන්ති සංස්ථාව විසින් ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම වෙත දන්වා තිබුණි. නව තොග ගබඩාවක් ස්ථාපනය කිරීම සඳහා සුදුසු ඉඩමක් ලබාගැනීමට නොහැකි වීම නිසා පවතින තෙල් තොග ගබඩාවම නවීකරණය හා පුළුල් කිරීම සිදුකර පවත්වාගෙන යාම සඳහා 2016 ඔක්තෝබර් 19 වන දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලැබී තිබුණි. නමුත් ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම විසින් සිමෙන්ති සංස්ථාවට ගෙවිය යුතු රු.මිලියන 105.00 ක හිඟ කුලී මුදල ගෙවා නොමැති බැවින් මෙම ව්‍යාපෘතිය 2018 ජුනි 30 දින වන විටත් ඉටු කිරීමට නොහැකි වී තිබුණි.

**(v) ලිහිසිතෙල් මිශ්‍ර කිරීමේ කර්මාන්ත ශාලාවක් ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය**

---

ශ්‍රී ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව විසින් මෙරට මුතුරාජවෙල ප්‍රදේශයේ ලිහිසිතෙල් නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් ආරම්භ කිරීම සඳහා මැලේසියාවේ හයිරැක්ස් ඔයිල් එස් ඩී එන් එච් ඩී සමාගම හා එක්ව 2016 මැයි 06 දින ගිවිසුම් 03 කට එළඹ තිබුණි. නමුත්, ඉහත ගිවිසුම්වල නියමයන් හා කොන්දේසි තුළ ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ ලිහිසිතෙල් ව්‍යාපාරයට අහිතකර බලපෑම් ඇතිවිය හැකි කරුණු අඩංගු බවත් ඇතැම් වගන්ති මඟින් ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථා පනත හා අමාත්‍ය මණ්ඩල තීරණ ඍජුව උල්ලංඝනය වන බවත් පෙන්වා දී තිබුණි. ඒ අනුව, ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය හා ඛනිජතෙල් නීතිගත සංස්ථාව විසින් ලිහිසිතෙල් කලවම් කිරීමේ කර්මාන්තශාලාවට අවශ්‍ය තෙල් වර්ග ආනයනය කිරීම, කලවම් කිරීම හා ප්‍රතිඅපනයනය කිරීම ආදී කටයුතුවලට අදාළ අවුරුදු 20 ක කාලයක් සඳහා වන බලපත්‍රය හයිරැක්ස් ඔයිල් සමාගම වෙත පවරා නොතිබුණි.

තවද, ඉහත ගිවිසුම්වල ප්‍රතිපාදන සංශෝධනය කිරීමට සංස්ථාව අදහස් කරන්නේ නම්, එම ගිවිසුම්වල සඳහන් පරිපාටිය අනුගමනය කළ යුතු බව 2018 ජනවාරි 23 දිනැති ලිපිය මඟින් නීතිපතිතුමා විසින් දන්වා තිබුණි. ඒ අනුව ගිවිසුම්වල යම් වගන්තියක් සංශෝධනය කිරීමට අවශ්‍ය නම් එය දෙපාර්ශවයේ අන්‍යෝන්‍ය එකඟතාවයෙන් සිදු කළ යුතුව තිබුණි. එසේ වුවත් අමාත්‍යාංශය විසින් එපරිදි කටයුතු නොකිරීම නිසා 2018 ජුනි 30 දින වන විටත් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වී නොතිබුණි.

**ඛනිජතෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලය**

---

**(i) නැගෙනහිර වෙරළ තීරයේ සිදු කෙරෙන ඒකාබද්ධ අධ්‍යයන වැඩසටහන (JS5 සහ JS6 බිම් කොටස්) - Joint Study in the Eastern Coast (JS5 and JS6 Blocks)**

---

ශ්‍රී ලංකාවේ නැගෙනහිර වෙරළ තිරයේ අධික ගැඹුරකින් යුත් JS5 සහ JS6 බිම් කොටස්වල ගවේෂණ කටයුතු සඳහා 2016 පෙබරවාරි 18 දින ශ්‍රී ලංකා රජය සහ ටොටාල් ඊ ඇන්ඩ් පී පෙට්‍රෝලියර්ස් තෙල් සමාගම අතර ඒකාබද්ධ ගවේෂණ ගිවිසුමක් අත්සන් කර තිබුණි. මෙහිදී, ඊස්ටර්න් එකෝ ඩී එම් සී සී (Eastern Eco DMCC) සමාගම ටොටාල් සමාගමේ බහුසේවා කොන්දේසි යටතේ දත්ත එකතු කරනු ලබන හවුල්කරු වන අතර ටොටාල් (TOTAL) සමාගම වෙනුවෙන් ඒකාබද්ධ අධ්‍යයන ප්‍රදේශය ආවරණය කරමින් ද්විමාන භූකම්පන දත්ත රැස්කිරීමේ කාර්යයට දායක වෙයි. නමුත් ශ්‍රී ලංකා රජයට ඊස්ටර්න් ඊකෝ ඩී එම් සී සී සමාගම සමඟ බහුසේවා ගිවිසුමට එළඹීම ප්‍රමාද වීම හේතුවෙන් 2018 ජුලි 30 දින දක්වා මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට නොහැකි වී තිබුණි.
මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ අරමුණු වූයේ දත්ත අර්ථකථනය හා නිරූපණය කිරීමෙන් ලැබෙන ප්‍රතිඵල මත ඛනිජතෙල් ගවේෂණය සහ නිෂ්පාදනය සඳහා ඛනිජතෙල් සම්පත් ගිවිසුම් සඳහා එළඹීමයි. මේ වන විටත් ව්‍යාපෘතිය ආරම්භ කිරීමට නොහැකි වීමෙන් දත්තමය සාක්ෂි නොමැතිව ඛනිජතෙල් ගවේෂණය සඳහා ආයෝජකයින් ආකර්ෂණය කර ගැනීමට නොහැකි වී තිබුණි.

**(ii) සමුද්‍රීය පාරිසරික දත්ත එකතු කිරීමේ අධ්‍යයන ව්‍යාපෘතිය (Marine Environmental Baseline Study)**

---

ඛනිජ තෙල් ගවේෂණ කටයුතු ආරම්භ කිරීමට පෙර මූලික පාරිසරික පරීක්ෂණයක් සිදු කිරීම අත්‍යවශ්‍ය අතර මෙවන් පරීක්ෂණයක් සිදු කොට වාර්තාවක් ලබා ගැනීමට සැලකිය යුතු කාලයක් ගත වීම නිසා ඛනිජ තෙල් ගවේෂණ කටයුතු ආරම්භ කිරීමට ප්‍රමාදයක් ඇති වේ. එබැවින් ව්‍යාපෘති පිරිවැය රු. මිලියන 37.16 ක් වන සමුද්‍රීය පාරිසරික දත්ත එකතු කිරීමේ අධ්‍යයන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය හා ඛනිජතෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලය අතර 2015 දෙසැම්බර් 30 දින ගිවිසුමකට එළඹී තිබුණි. 2016 දෙසැම්බර් 28 දින දක්වා මේ සඳහා රු. 29,082,077 මුදලක් ඛනිජතෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලය විසින් ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනයට ගෙවා තිබුණි.

සමුද්‍රීය පාරිසරික දත්ත එකතු කිරීමේ ව්‍යාපෘතිය තුළින් බලාපොරොත්තු වූයේ ශ්‍රී ලංකාවේ විවිධ පර්යේෂකයන් මේ දක්වා එකතු කොට ඇති සමුද්‍රීය දත්ත එක පද්ධතියකට ස්ථානගත කිරීමයි. සමුද්‍රීය පාරිසරික දත්ත එකතු කිරීමේ අධ්‍යයන වාර්තාවක් සැකසීම හා දත්ත සමුදායක් (Database) සැකසීම මෙම ව්‍යාපෘතියේ නිම කළ යුතු කාර්යයන් වේ. ගිවිසුමට එළඹී මාස 08 ක් ඇතුළත එනම් 2016 අගෝස්තු මස 30 දිනට මෙම කාර්යයන් අවසන් කර භාරදිය යුතුය. නමුත් 2018 ජුලි 30 දින වන විටත් ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිත ආයතනය අදාල අතුරු වාර්තා ඉදිරිපත් කර තිබුණ ද අවසන් වාර්තාව මෙතෙක් ඉදිරිපත් කර

නොතිබුණි. කෙසේ නමුත් ගිවිසුම් ප්‍රකාරව කාර්යයන් ඉටු කිරීමට ප්‍රමාද වූ විට ඒ සම්බන්ධව අනුගමනය කළ යුතු විධිවිධාන ගිවිසුමෙහි ඇතුළත් කර නොතිබුණි.

**2.4.1 ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් සැපයීම් හා සේවා ලබා ගැනීම**

-----------------------------------------------------------------

අමාත්‍යාංශය විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කරමින් සැපයීම් හා සේවා ලබා ගත යුතු වූ රු මිලියන .12.44 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉන් රු මිලියන.12.14 ක් උපයෝජනය කර තිබුණි.

**2.4.1 ප්‍රසම්පාදනයන් සැලසුම් කිරීම**

-------------------------------

අමාත්‍යාංශය වෙත මෙහෙයුම් වැඩසටහන් යටතේ සමාලෝචිත වර්ෂයේ දී ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් සැපයීම් හා සේවා ඉටු කර ගැනීම සඳහා රු.මිලියන 11.625 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර, ඉන් රු.මිලියන 9.00 ක් උපයෝජනය කර තිබුණි. සලසා තිබුණු ප්‍රතිපාදනය සම්බන්ධයෙන් පිළියෙල කළ යුතු ප්‍රසම්පාදන සැලැසුම පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**ප්‍රසම්පාදන සැලැසුම් කිරීම සහ ප්‍රාරම්භක අවධිය**

-----------------------------------------------------------

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2006 හි 4(2) මාර්ගෝපදේශය ප්‍රකාරව අවම වශයෙන් වසර 3 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධයෙන් ප්‍රසම්පාදන සැලැස්ම සකස් කළ යුතු විය. නමුත්, රු.මිලියන 12.7 ක් වටිනා විෂයයන් 04 ක් සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් 2017 වර්ෂයට පමණක් සකස් කර තිබුණි.

(ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4(2)(3) මාර්ගෝපදේශයේ දැක්වෙන පරිදි ප්‍රසම්පාදන සැලැස්ම නිතිපතා යාවත්කාලීන කිරීම ප්‍රසම්පාදන ආයතනයේ වගකීමකි. නමුත් ඊට අනුගත නොවී කටයුතු කර තිබුණි.

(i) 2017 වර්ෂය තුළ රු.503,696 ක් වැයකර තිබුණ ද ප්‍රසම්පාදන සැලැස්ම ඒ අනුව යාවත්කාලීන කර නොතිබුණි.

(ii) ප්‍රසම්පාදන සැලැස්මේ ඇස්තමේන්තුගත ප්‍රමාණය හා වටිනාකම දක්වා පහත පරිදි මිලදී ගැනීම් සිදුකර තිබුණි.

| අයිතමය | ප්‍රසම්පාදන සැලසුමේ ඇස්තමේන්තුගත ප්‍රමාණය | සත්‍ය වශයෙන් මිලදී ගත් ප්‍රමාණය | ප්‍රසම්පාදන සැලසුමේ ඇස්තමේන්තුගත පිරිවැය | සත්‍ය පිරිවැය |
|---|---|---|---|---|
| | | | රු. | රු. |
| රූපවාහිනි 32'/40' | 2 | 3 | 80,000 | 269,970 |
| මුද්‍රණ යන්ත්‍ර | | | | |
| වර්ණ | 4 | 06 | 100,000 | 173,400 |
| කළු සුදු | 4 | 10 | 100,000 | 109,000 |

## 2.5 වත්කම් කළමනාකරණය

---------------------------

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේ දී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

### (අ) වාහන උපයෝජනය

---------------------

අමාත්‍යාංශය වෙත සමාලෝචිත වර්ෂය අවසන් වන විට පහත සඳහන් පරිදි වාහන 33 ක් පැවැති අතර, එම වාහනවලින් කිලෝමීටර් 541,277 ක් ධාවනය කර තිබුණි. ඒ සඳහා ඉන්ධන හා ලිහිසි තෙල් සඳහා රු. 1,269,175 ක්ද, වාහන සේවා කිරීම සඳහා රු. 2,416,388.95 ක්ද, වාහන අළුත්වැඩියා සඳහා රු. 8,311,679.99 ක්ද හා වාහන රක්ෂණය කිරීම සඳහා රු. 2,615,688.12 ක්ද වශයෙන් එකතුව රු. 14,612,932.06 ක් වැය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය විසින් වාහන ධාවනය කිරීම සඳහා රියදුරු වැටුප් හා දීමනා හැර කිලෝමීටරයක් සඳහා රු. 27 ක් වැය කර තිබුණි.

**අමාත්‍යතුමා, නියෝජ්‍ය අමාත්‍යතුමිය හා එතුමන්ලාගේ කාර්ය මණ්ඩල විසින් වාහන පරිහරණය කිරීම.**

---------------------------------------------------------------------------------------------

2017 වර්ෂයේ අමාත්‍යාංශයේ සිදු වූ රිය අනතුරු 31 ක් අතුරින් අනතුරු 18 ක් හෙවත් සියයට 58 ක් ගරු ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමා, නියෝජ්‍ය අමාත්‍යතුමිය හා එතුමන්ලාගේ කාර්යය මණ්ඩල වෙත අනුයුක්ත කර ඇති වාහන සම්බන්ධයෙන් සිදු වී ඇති අනතුරු බව නිරීක්ෂණය විය.

### (ආ) මූල්‍ය හා මෙහෙයුම් කල් බදු ක්‍රමය යටතේ වාහන උපයෝජනය

---------------------------------------------------------------------

අමාත්‍යාංශය විසින් මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ වාහන කිසිවක් ලබාගෙන නොතිබුණු අතර මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ භාණ්ඩාගාරය විසින් වාහන 09 ක් ලබාගෙන අමාත්‍යාංශයට භාර දී තිබුණි. එම වාහන වෙනුවෙන් ඉන්ධන හා ලිහිසි තෙල් සඳහා රු. 229,900 ක්ද, අළුත්වැඩියා සඳහා රු. 951,273.22 ක්ද, සේවා කිරීම සඳහා රු. 715,797.59 ක්ද, වාහන රක්ෂණය සඳහා රු. 583,535.98 ක්ද, වශයෙන් (කල්බදු වාරික, රියදුරු වැටුප් හා දීමාන හැර) එකතුව රු. 2,480,506.79 ක් වැය කර තිබුණි. කල්බදු ක්‍රමය යටතේ ලබාගත් වාහනවලින් කිලෝමීටර් 197,108 ක් ධාවනය කර තිබුණි. ඒ අනුව එම වාහනවලින් එක් කිලෝමීටරයක් ධාවනය කිරීම සඳහා කල්බදු වාරික, රියදුරු වැටුප් හා දීමාන හැර රු. 12.58 ක් වැය කර තිබුණි.

### (ඇ) කාර්යාල පවත්වා ගැනීමේ වියදම්

-------------------------------------

අමාත්‍යාංශය සතුව කිසිදු ගොඩනැගිල්ලක් නොමැති අතර, වාර්ෂිකව රු.මිලියන 22.03 ක කුලියක් මත ලබාගත් ගොඩනැගිලි 03 ක කාර්යාලය පවත්වා ගෙන යනු ලැබේ. වාර්ෂික පිරිසිදු කිරීමේ ගාස්තුව රු. මිලියන 2.76 ක් වේ. ඒ අනුව මුළු ගොඩනැගිලි වෙනුවෙන් වූ වියදම රු. 24,794,919 ක් වී තිබුණි. ඒ අනුව ඒක පුද්ගල කාර්යාලය පවත්වා ගෙන යාමේ වියදම රු. 330,599 ක් වී තිබුණි.

(ඇ) **වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

---------------------------------------

2017 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තා 2018 මාර්තු 31 දින හෝ ඊට පෙර විගණනය වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණ ද, දින 23 ක ප්‍රමාදයකින් පසුව 2018 අප්‍රේල් 23 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. එම චක්‍රලේඛයේ 3.1.5 ඡේදය ප්‍රකාරව විනාශ කළ යුතු, අළුත්වැඩියා කළ යුතු හා වෙනත් රජයේ ආයතනවලට පැවරිය හැකි භාණ්ඩ සම්බන්ධයෙන් 2017 පෙබරවාරි 26 දින හෝ ඊට පෙර කටයුතු කර අවසන් කළ යුතු වුවත්, 2018 මැයි 31 දින වන විටත් එය ඉටුකර නොතිබුණි.

(ඉ) **බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

----------------------------------------

අමාත්‍යාංශය සතු රු. මිලියන 5.80 ක් වටිනා මෝටර් රථය 2017 අගෝස්තු 15 දින සිට මේ දක්වා ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම වෙත අවිධිමත් ලෙස මුදාහැර තිබුණු බව නිරීක්ෂණය විය.

(ඊ) **වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම**

-----------------------------------------------------------

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ හා ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ වටිනාකම් පිළිවෙලින් රු. මිලියන 17.90 ක් හා රු. මිලියන 7.84 ක් වන මෝටර් රථ 02 ක් 2015 ඔක්තෝබර් 09 දින හා 2017 අගෝස්තු 15 දින සිට මේ දක්වා අමාත්‍යාංශය විසින් භාවිතයට ගෙන තිබුණු අවස්ථා නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

## 2.6 අනාර්ථික ගනුදෙනු

-------------------------

ඛනිජතෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලයේ නිලධාරීන් විසින් මුදල් රෙගුලාසි 156(7) හා 780 ට අනුගත නොවී කටයුතු කිරීම නිසා සේවක අර්ථසාධක අරමුදල් හා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල්වලට බැර විය යුතු දායක මුදල් නියමිත පරිදි බැර නොකිරීම හේතුවෙන් සේවක අර්ථසාධක අරමුදලට අතිරේක දායක මුදලක් ලෙස රු.මිලියන 2.27 ක් ද, සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට අධිභාර ලෙස රු.මිලියන 0.43 ක් ද වශයෙන් එකතුව රු.මිලියන 2.70 ක් අතිරේකව ගෙවා තිබුණි.

## 2.7 කළමනාකරණ දුර්වලතා

--------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) **තිරසර සංවර්ධන අරමුණු ලඟා කර ගැනීම**

(i) තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 ‘‘න්‍යාය පත්‍රය’’ ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව අමාත්‍යාංශය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන්ට සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනා ගැනීමට කටයුතු කොට නොතිබුණි.

(ii) තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ කාර්යභාරය සම්බන්ධව උනන්දුවක් දක්වන පාර්ශවයන් ලෙස, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය, තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය, ලංකා

ඛනිජතෙල් නීතිගත සංස්ථාව, ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම සහ ඛනිජතෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලය යන පාර්ශවයන් හඳුනාගත හැකිව තිබුණි. එහෙත් අමාත්‍යාංශයට අදාළ ඉලක්ක පිළියෙල කිරීමේදී සහභාගීත්ව ප්‍රවේශයක් නිරූපනය නොවන බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.

(iii) කිසියම් කාර්යයක නිවැරදි කාර්යසාධනය මැනීම සඳහා නිවැරදි දත්ත පදනමක් පැවතීම අත්‍යාවශ්‍ය වුවත්, ආයතනය විසින් තිරසර සංවර්ධන ඉලක්කයන්හි ළඟාවීම මැන බැලීම සඳහා නිවැරදි දත්ත පදනමක් බිහිකර ගැනීමට කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය. තවද, මේ සඳහා මූල්‍ය ප්‍රතිපාදන මෙන්ම මානව හා භෞතික සම්පත් යොදා ගැනීමේ ක්‍රමවේදයක් හඳුනාගෙන නොතිබුණු බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.

(iv) අමාත්‍යාංශය විසින් තමාට සෘජුවම අදාළ වන තිරසර සංවර්ධන අරමුණ ලෙස "දැරිය හැකි පිවිතුරු බලශක්තිය" හඳුනාගෙන තිබුණද, එය ඉටුවන ආකාරයට 2017 වර්ෂය තුල කිසිඳු ව්‍යාපෘතියක් සැලසුම් කොට නොතිබුණි.

(ආ) මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ 2017 ජුලි 25 දිනැති අංක 2/2017 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 6.1 ඡේදය යටතේ දැනට ක්‍රියාත්මක වන ව්‍යාපෘති හරහා දිළිඳුකම පිටුදැකීමේ වැඩසටහන් වශයෙන් "ඉන්ධන මිල අඩු කිරීම හා භූමිතෙල් සහනාධාර ලබා දීම" යන වැඩසටහන් ක්‍රියාත්මක කළ නමුත්, එම දිනෙන් පසු එළැඹෙන කාලපරිච්ඡේදය තුළ ඉන්ධන මිල ගණන් ඉහළ දමා තිබුණි.

**2.8 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම**

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ අමාත්‍යාංශයට සලසා තිබුණ ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 2013 | පුනරාවර්තන | 115.00 | 110.71 | 4.29 | 3.73 |
| | මූලධන | 17.00 | 12.94 | 4.06 | 23.88 |
| | **එකතුව** | **132.00** | **123.65** | **8.35** | **6.33** |
| 2014 | පුනරාවර්තන | 133.50 | 132.18 | 1.32 | 0.99 |
| | මූලධන | 34.05 | 30.33 | 3.72 | 10.93 |
| | **එකතුව** | **167.55** | **162.51** | **5.04** | **3.01** |
| 2015 | පුනරාවර්තන | 4,653.98 | 4,652.78 | 1.20 | 0.03 |
| | මූලධන | 190.00 | 91.03 | 98.97 | 52.09 |
| | **එකතුව** | **4,843.98** | **4,743.81** | **100.18** | **2.07** |
| 2016 | පුනරාවර්තන | 214.67 | 213.50 | 1.18 | 0.54 |
| | මූලධන | 228.10 | 192.26 | 35.84 | 15.71 |
| | **එකතුව** | **442.77** | **405.76** | **37.01** | **8.36** |
| 2017 | පුනරාවර්තන | 236.99 | 230.22 | 6.77 | 2.86 |
| | මූලධන | 93.62 | 80.10 | 13.52 | 14.45 |

| | | | | |
|---|---|---|---|---|
| **එකතුව** | **330.61** | **310.32** | **20.29** | **6.14** |

## 2.9 ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම

----------------------------------------

අමාත්‍යාංශය විසින් 2017 වර්ෂය සඳහා ආදායම් සංකේත එකක් සඳහා එකතුව රු.මිලියන 95.16 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.මිලියන 120.10 ක ආදායමක් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 126.21 ක් වී තිබුණි.

**(අ) 20.03.02.21 දරන ආදායම් සංකේතය - ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශයට අදාළ හේතු**

------------------------------------------------------------------------------------------

පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

(i) සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව අනුව ආදායම් රැස් කිරීම රු.මිලියන 95.16 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.මිලියන 120.10 ක් ආදායම් රැස් කර තිබුණි. ඒ අනුව සංශෝධිත ඇස්තමේන්තුව රු. මිලියන 24.94 කින් හෙවත් සියයට 26 කින් ඉක්මවා ආදායම් රැස්කර තිබුණි.

(ii) විගණනයට ඉදිරිපත් කළ ආදායම් ගිණුම අනුව රු. මිලියන 9.81 ක ආදායම් හිඟහිට තිබුණු අතර, එම හිඟ හිටි ආදායමෙන් රු. මිලියන 0.81 ක් වර්ෂ 01 සිට 02 ක් දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණි. රු. මිලියන 9.00 ක් 2017 වර්ෂයට අදාල හිඟ හිටි ආදායම වී තිබුණි.

(iii) අමාත්‍යාංශයේ 2017 වර්ෂයේ සංශෝධිත ඇස්තමේන්තුව හා ශුද්ධ ආදායම් රැස්කිරීම රු.මිලියන 24.94 කින් ඉක්මවීම සඳහා තාර ද්‍රව්‍ය ආනයනය සඳහා නව වාර්ෂික බලපත්‍ර ලබාගැනීමට නව ව්‍යාපාරිකයන් ලියාපදිංචි වීම, ලිහිසි ද්‍රව්‍ය ආනයන වාර්ෂික බලපත්‍ර ගාස්තු සංශෝධනය වීම හා හිඟ ආදායම් ලැබීම හේතු ලෙස දක්වා තිබුණි. එසේ වුවත්, ඒ තුළ ඇති රු.මිලියන 15.00 ක් ලිහිසි ද්‍රව්‍ය ආනයනය සඳහා බලපත්‍රලාභී ආයතන 06 ක් විසින් 2018 ඉදිරි අර්ධ වර්ෂය වෙනුවෙන් 2017 වර්ෂයේදී ගෙවනු ලැබූ බලපත්‍ර ගාස්තු බව නිරීක්ෂණය විය.

## 2.10 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

----------------------------------------

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

----------------------------------------------------

අමාත්‍යාංශයට අදාළ විෂය අංක 15001 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 6.00 | 5.97 | 2.3 | 2.71 | 13.00 | 11.87 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

**හිඟහිටි ණය ශේෂ අයකර නොගැනීම**

2012 වර්ෂයේදී සේවය අතහැර ගිය රියදුරු මහතෙකුගෙන් අයවිය යුතු රු.74,634 ක ණය ශේෂය අයකර ගැනීමට අමාත්‍යාංශය විසින් විවිධ ක්‍රියාමාර්ග ගෙන තිබූ නමුත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම ණය ශේෂය අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

## 2.11 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|
| ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891(1) | පවත්වා නොතිබුණි. |
| හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 | විධිමත්ව පවත්වා නොතිබුණි. |
| වාහන ලොග් පොත | මුදල් රෙගුලාසි 1645 (අ) | යාවත්කාලීන කර නොතිබුණි. |
| ණය සහ අත්තිකාරම් ලේඛනය | 2017 ජුලි 05 දිනැති අංක 256/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 05 ඡේදය | විධිමත්ව පවත්වා නොතිබුණි. |
| නිවාඩු පිළිබඳ ලේඛනය | ආයතන සංග්‍රහයේ XII පරිච්ඡේදයේ 1.7 | විධිමත්ව පවත්වා නොතිබුණි. |
| ධාවන සටහන් පොත් | මුදල් රෙගුලාසි 1645 | විධිමත්ව පවත්වා නොතිබුණි. |
| වාහන සම්බන්ධ සටහන් | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.3 ඡේදය | පවත්වා නොතිබුණි. |

## 2.12 අනුකූල නොවීම

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | | | අනුකූල නොවීම |
|---|---|---|---|
| **(අ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| | (i) | මුදල් රෙගුලාසි 103 (1) (ආ) | අමාත්‍යාංශයේ රිය අනතුරු 19 ක් පිළිබඳව පොලිසියට වාර්තා කර නොතිබුණි. |

| | |
|---|---|
| (ii) මුදල් රෙගුලාසි 103(1)(උ) | හානිවීම් නැවත නැවත ඇතිවීම වැළැක්වීම සඳහා ප්‍රමාණවත් තරම් පියවර ගත යුතු වුවත් වාහන සම්බන්ධයෙන් පවතින අභ්‍යන්තර පාලන ක්‍රමයේ දුර්වලතාවය හේතු කොට ගෙන අනතුරු සංඛ්‍යාවේ වේගවත් වර්ධනයක් විගණනයේ දී නිරීක්ෂණය විය. 2016 වර්ෂයේ රිය අනතුරු 11 ක් සිදු වී තිබුණ අතර එය 2017 වර්ෂය තුළ 31 ක් දක්වා ඉහළ ගොස් තිබුණි. මේ අනුව පසුගිය වර්ෂය සමඟ සැසඳීමේ දී රිය අනතුරු සංඛ්‍යාව සියයට 182 කින් ඉහළ ගොස් තිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 101(1) හා 105(4) | අලාභ හානිය පිළිබඳ වගකීම පැවරී ඇති නිලධාරියාගෙන් අලාභය අය කර ගත යුතු හා ඊට අමතරව ඒ නිලධාරීන්ට විරුද්ධව නිසි බලධරයන් විසින් අවශ්‍ය තැන්හිදී ආයතන සංග්‍රහය යටතේ විනයානුකූලව වෙන් වෙන් වශයෙන් කටයුතු කළ යුතු වේ. අමාත්‍යාංශයේ වාහන අනතුරු අතුරින් 15 ක් ම රියදුරන්ගේ නොසැලකිල්ල මත සිදු වූ අනතුරු වන අතර එම රියදුරන් සම්බන්ධයෙන් ඉහත රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට නොතිබුණි. |
| (iv) මුදල් රෙගුලාසි 101(3) | හානි පිළිබඳ පරිපූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමට දින හතකට වැඩි ප්‍රමාණයක් සිදු වේ යැයි අපේක්ෂා කරන්නේ නම් ප්‍රාරම්භක වාර්තාව වහාම විගණකාධිපති වෙත එවිය යුතු වුවත් අමාත්‍යාංශයේ රිය අනතුරු පිළිබඳ ප්‍රාරම්භක වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට සති 02 ත් මාස 08 ත් අතර කාලයක් ප්‍රමාද කර තිබූ බව නිරීක්ෂණය විය. |
| (v) මුදල් රෙගුලාසි 104(4) | අනතුරු පිළිබඳ පරීක්ෂණයෙන් පසු අලාභය සිදු වූ දිනයේ සිට තුන් මසක් ඇතුළත දී පූර්ණ වාර්තාව විගණකාධිපතිට ඉදිරිපත් කළයුතු වුවත් අමාත්‍යාංශයේ රිය අනතුරු පිළිබඳ පූර්ණ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට මාස 03 ත් 07 ත් අතර කාලයක් ගත කොට තිබුණු බව නිරීක්ෂණය විය. |
| (vi) මුදල් රෙගුලාසි 155 | මුදල් රෙගුලාසියේ විධිවිධානවලට පටහැනිව නිකුත් කළ විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීමේ දී දින 34 සිට දින 45 ක කාල ප්‍රමාදයකින් පසුව විගණන විමසුම් සඳහා පිළිතුරු ඉදිරිපත් කර තිබුණි. |

(ආ) **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

| | |
|---|---|
| (i) 1992 අගෝස්තු 19 දිනැති අංක 26/92 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | රජයේ වාහනවල රාජ්‍ය ලාංඡනය යෙදිය යුතු වුවත් අමාත්‍යාංශයේ වාහන 13 ක රාජ්‍ය ලාංඡනය යොදා නොතිබුණි. |
| (ii) 2002 පෙබරවාරි 25 දිනැති | රජයේ වාහන සඳහා අදාල ආයතනයේ නම යෙදිය යුතු |

| | |
|---|---|
| අංක 01/2002 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | වුවද ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය සතු වාහන13 ක අමාත්‍යාංශයේ නම සඳහන් කර නොතිබුණි . |

**2.13 මානව සම්පත් කළමනාකරණය**

**2.13.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

ඉහත 2.1 ඡේදයේ සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය, පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අමාත්‍යාංශය විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු.මිලියන 68.21 ක් වැය කර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම රු. 909,517.84 ක් වී තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 16 | 13 | 03 |
| (ii) | තෘතියික මට්ටම | 03 | 02 | 01 |
| (iii) | ද්විතියික මට්ටම | 51 | 39 | 12 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 27 | 21 | 06 |
| | එකතුව | 97 | 75 | 22 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

**අනුමත කාර්යමණ්ඩලය බඳවා නොගැනීම**

තාත්වික සේවා මට්ටමක් පවත්වා ගැනීමට හා සේවක සංඛ්‍යාව පිළිබඳ කාලීන සමාලෝචනයක් කිරීමට නොහැකි වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික ශ්‍රේණිවල පුරප්පාඩු 03 ක්ද, තෘතීය මට්ටමේ පුරප්පාඩු 01 ක්ද, ද්විතීය මට්ටමේ පුරප්පාඩු 12 ක්ද, ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 06 ක්ද වශයෙන් ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ පුරප්පාඩු 22 ක් පැවතුණි.

**2.14 රජයේ නිලධාරීන් ඇප තැබීම**

මුදල් රෙගුලාසි 880 හි විධිවිධාන ප්‍රකාරව අමාත්‍යාංශයේ ඇප තැබිය යුතු නිලධාරීන්ගෙන් ඇප තැන්පත් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.